# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 අප්‍රේල් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින.]

එල්. ඩී.—ඔ. 14/86. (III)

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 2 වන වගන්තිය "මහා නගර සභාව, නගර සභාව, සුළු නගර සභාව සහ ගම්කාර්ය සභාව" යන වචන වෙනුවට, "මහා නගර සභාව, නගර නගර සභාව සහ ප්‍රාදේශීය සභාව" යන වචන ආදේශ කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 262 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය "නාගරිකය, නගරය හෝ යම් ප්‍රදේශය" යන වචන වෙනුවට, "නාගරිකය, නගරය හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1983 අංක 48 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) (1) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අවස්ථාවෝචිත පරිදි, නගර සභා ආඥාපනතේ 184 වන වගන්තිය යටතේ හෝ ප්‍රාදේශීය සභා පනතේ 185 වන වගන්තිය යටතේ පළ කරන ලද නියමයක් මගින්, නියමිත දිනයෙන් පසුව යම් විටක දී, යම් නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපති හෝ සභික ධුරයෙන් ඉවත් කරනු ලබන කිසිම තැනැත්තකු, ධුරයෙන් එසේ ඉවත් කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් මේ ආඥාපනත යටතේ තෝරා පත් කරගනු ලැබීමට හෝ අපේක්ෂක වීමට හෝ ඡන්දය දීමට සුදුසුකම් නොලැබිය යුතු ය.".

ඒ 094624—7,685 (86/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඡන්ද විමසීම පැවැත්වෙන දිනය.

25. පළාත් පාලන ආයතනයක සභිකයන් පිළිබඳ වූ සෑම ඡන්ද විමසීමක් ම, තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන්ගේ ධුර කාලය ආරම්භ විය යුතු දිනයට පෙරාතුව වූ මාස හතරක කාලය ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය වැඩිදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) (අ) ඡේදයෙන් නියමිත තැන්පත් මුදල, ඒ ස්වාධීන කණ්ඩායම විසින් නම් කරනු ලබන එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් රුපියල් දෙසිය පණහක මුදලක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "ගම්කාර්ය ප්‍රදේශයක් වේ" යන වචන වෙනුවට, "ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් වේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "උප නගරාධිපති" යන අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"උප නගරාධිපති" යන්නෙන්, මහා නගර සභාවක උප නගරාධිපති හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක උප සභාපතිවරයා අදහස් වේ ;";

(ආ) "පළාත් පාලන ආයතනය" යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ ;";

(ඇ) "නගරාධිපති" යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"නගරාධිපති" යන්නෙන්, මහා නගර සභාවක නගරාධිපතිවරයා හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා අදහස් වේ ;";

(ඈ) "තත් කාලයෙහි ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු ලේඛනය" යන අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්—

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන්, ප්‍රාදේශීය සභා පනතේ අර්ථානුකූලව යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් අදහස් වේ ;";

(ඉ) "නගරය" යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"'නගරය' යන්නෙන්, නගර සභා ආඥාපනතේ අර්ථානුකූලව යම් නගරයක් අදහස් වේ."; සහ

(ඊ) "ගම් ප්‍රදේශය" යන අර්ථකථනය අත්හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

9. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, "නාම යෝජනා පත්‍රයේ ආකෘතිය" යන්නේ සිට "නම් කරනු ලැබේ" යන්න දක්වා ඇති සියලුම වචන වෙනුවට, පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"නාම යෝජනා පත්‍රයේ ආකෘතිය

(28 (2) වන වගන්තිය)

...............සභාව/ප්‍රාදේශීය සභාව ............... මහා නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ සභිකයන් තෝරාපත් කර ගැනීම සඳහා පවත්වනු ලබන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයන් වශයෙන් පහත නම් සඳහන් තැනැත්තන් ඔවුන්ගේ නම් දැක්වෙන ප්‍රමුඛතා පිළිවෙළ අනුව, පිළිගත් දේශපාලන පක්ෂයක් වන............... පක්ෂය විසින්/ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් විසින් මෙයින් නම් කරනු ලැබේ. තව, පළමුව හා දෙවනුව නම්කර ඇති අපේක්ෂකයන් ඊට අනිශ්චිතව ඒ සභාවේ/ප්‍රාදේශීය සභාවේ පිළිවෙළින් නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන්/පිළිවෙළින් සභාපතිවරයා සහ උප සභාපතිවරයා වශයෙන් තෝරාපත් කර ගැනීම සඳහා අපේක්ෂකයන් වශයෙන් නම් කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**10.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

"හතරවන උපලේඛනය

(76 (1) වන වගන්තිය)

රහස්‍යතා ප්‍රකාශනයේ ආකෘතිය

.................. වන මම, .............. මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා පැවැත්වෙන මේ ඡන්ද විමසීමේ දී මා හට කියවා දෙන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76* වන වගන්තියෙන් තහනම් කෙරෙන කිසිවක් නොකරන බව ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

————————,
ප්‍රකාශකගේ අත්සන

————————————,
ප්‍රකාශනය ගනු ලබන තැනැත්තාගේ අත්සන.

* සැලකිය යුතුයි—ප්‍රකාශනය ගනු ලබන තැනැත්තා විසින්, මේ වගන්තිය ප්‍රකාශකට කියවා දෙනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.